PSC/APP/4/92/2017

2018 අගෝස්තු මස වැනි දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරු,

දෙපාර්තමේන්තු ප්‍රධානින් වෙත,

<u>කාර්යක්ෂමතා කඩඉම් විභාග නිසි පරිදි පැවැත්වීම</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ට අනුකූලව සංශෝධිත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටිවලට අනුව වසරකට දෙවතාවක් කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්විය යුතු බව සඳහන් කර ඇත. නමුත් පත්වීම් බලධාරියා/ පරිපාලන බලධාරියා විසින් සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනිමේ පරිපාටි ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් නිසි කලට සිදු නොකිරීම මත නිරන්තර කාර්යක්ෂමතා කඩඉම් සහන ඉල්ලීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වන බව නිරීක්ෂණය කර ඇත.

02. උදාහරණයක් ලෙස ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක 02/2016 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවන අතර එමගින් කාර්යාල සේවක සේවය හා රියදුරු මහතුන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කටයුතු කල යුතු ආකාරය සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුවත් කර ඇති අතර එම ආකාරයට ඇතැම් ආයතනවල සේවයේ නියුතු නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම සම්බන්ධව කටයුතු නිසි පරිදි ඉටු නොකරනු ලබන බව පෙනී යයි.

03. මෙම තත්ත්වය මත සේවා ස්ථිර කිරීම් හා උසස්වීම් හිදී නිලධාරීන් අපහසුතා හා ප්‍රමාදවීම් වලට ලක්වීම් සිදු වේ. එම තත්ත්වය නිසා ප්‍රශස්ත සේවාවක් නිලධාරියා වෙතින් ලබා ගැනීම අපහසු වේ. එබැවින් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීම පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ද පසු විපරම් කිරීමට බලාපොරොත්තු වන බැවින් ඔබ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු යටතේ කාර්යක්ෂමතා කඩඉම් පැවැත්විය යුතු තනතුරු සඳහා වූ 2018 වර්ෂය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාග සැලසුම් ඇමුණුම 01 හි සඳහන් ආකාරයට සම්පූර්ණ කර 2018.11.30 දිනට පෙර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස කාරුණිකව දන්වමි.

04. 2019 වර්ෂය සඳහා වන විභාග සැලසුම ද විභාගය පවත්වන ආයතනය (උදා - විභාග දෙපාර්තමේන්තුව) සමඟ සාකච්ඡා කර 2018.12.20 දිනට පෙර ඇමුණුම 02 හි සඳහන් ආකාරයට එවීමට කටයුතු කරන ලෙස ද දන්වමි.

05. කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීම පිළිබඳව සුදුසු පරිදි අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු ප්‍රගති සමාලෝචන රැස්වීම් හෝ මාණ්ඩලික නිලධාරී රැස්වීම් න්‍යාය පත්‍රයට ඇතුලත් කර ගනිමින් පසු විපරම් ක්‍රමවේදයක් අඛණ්ඩව පවත්වා ගන්නා ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

එම්.ඒ.බී. දයා සෙනරත්

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

# 2018 වර්ෂය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාග සැලසුම

අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ නම -

| 1 | 2 | 3 | | | 4 | 5 | | | 6 |
|---|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | අනුමත තනතුර | අනුමත නිලධාරී සංඛ්‍යාව | | | විභාගය පැවැත්වීමට අපේක්ෂිත දිනය | විභාගය පවත්වා ඇත්නම් පැවැත් වූ දිනය | | | විභාගය පැවැත්වීම ප්‍රමාද වීමට හේතුව |
| | | පළමු කා.ක.ප | දෙවන කා.ක.ප | තෙවන කා.ක.ප | | පළමු කා.ක.ප | දෙවන කා.ක.ප | තෙවන කා.ක.ප | |
| 1 | A | | | | | | | | |
| 2 | B | | | | | | | | |
| 3 | C | | | | | | | | |
| 4 | D | | | | | | | | |
| 5 | E | | | | | | | | |
| 6 | F | | | | | | | | |
| 7 | G | | | | | | | | |
| 8 | | | | | | | | | |
| 9 | | | | | | | | | |
| 10 | | | | | | | | | |

- අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු සඳහා ද උක්ත වගුවේ සඳහන් ආකාරයට විභාග සැලැස්ම ඉදිරිපත් කළ යුතුය.
- රාජ්‍ය පරිපාලන , කළමනාකරණ සහ නීතිය හා සාමය පිළබඳ අමාත්‍යාංශය උක්ත විභාග සැලැස්ම ඉදිරිපත් කිරීමේ දී දීප ව්‍යාප්ත සේවාවන් ට අදාලව ද වෙන් වශයෙන් විභාග සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය.
- 2018 වර්ෂයේ මාස 07ක් පසු වී ඇති බැවින් උක්ත වගුවේ 5 හා 6 තීරු සම්පූර්ණ කළ හැකි නම් පමණක් අදාල තොරතුරු ඉදිරිපත් කළ යුතුය.
- නොඑසේනම් 5 හා 6 තීරු 2018 වර්ෂයට අදාලව සම්පූර්ණ කර **2018.12.25** දිනට පෙර ඉදිරිපත් කළ යුතුය.

# 2019 වර්ෂය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාග සැලසුම

අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ නම -

| 1 | 2 | 3 | | | 4 | 5 | | | 6 |
|---|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | අනුමත තනතුර | 2019 වර්ෂය සඳහා විභාගය පැවැත්වීමට අපේක්ෂිත දිනය | | | පවත්වනු ලබන ආයතනය | විභාගය පවත්වා ඇත්නම් පැවැත් වූ දිනය | | | විභාගය පැවැත්වීම ප්‍රමාද වීමට හේතුව |
| | | පළමු කා.ක.ප | දෙවන කා.ක.ප | තෙවන කා.ක.ප | | පළමු කා.ක.ප | දෙවන කා.ක.ප | තෙවන කා.ක.ප | |
| 1 | A | | | | | | | | |
| 2 | B | | | | | | | | |
| 3 | C | | | | | | | | |
| 4 | D | | | | | | | | |
| 5 | E | | | | | | | | |
| 6 | F | | | | | | | | |
| 7 | G | | | | | | | | |
| 8 | | | | | | | | | |
| 9 | | | | | | | | | |
| 10 | | | | | | | | | |

- උක්ත වගුවේ තීරු අංක 2 සිට 4 දක්වා සම්පූර්ණ කර **2018.12.20** දිනට පෙර ඉදිරිපත් කළ යුතුය.
- උක්ත වගුවේ තීරු අංක 5 හා 6 , තීරු 2 සිට 4 දක්වා සම්පූර්ණ කර එවන ලද ලේඛනය අනුව සම්පූර්ණ කර **2020.01.20** දිනට පෙර ඉදිරිපත් කළ යුතුය.

PSC/APP/4/92/2017

2018 අගෝස්තු මස වැනි දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරු,

<u>**කාර්යක්ෂමතා කඩඉම් විභාග නිසි පරිදි පැවැත්වීම**</u>

උක්ත කරුණ සම්බන්ධ මගේ සමාංක හා 2018.08.01 දිනැති ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා එවමි.

02. එම ලිපියට අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට අදාල පියවර ගන්නා ලෙසත්, එම ලිපියෙහි සඳහන් පරිදි කටයුතු කරන ලෙස ඔබ අමාත්‍යාංශයට අයත් සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

රාධා නානායක්කාර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පත්වීම්)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට